# වාර්ෂික වාර්තාව - 2014



## උද්භිද උද්‍යාන භාර අරමුදල

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# පේරාදෙණිය

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2014 (Annual Report – 2014)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

## උද්භිද උද්‍යාන භාර අරමුදල

| | | |
|---|---|---|
| 1. අරමුදලේ නම | : | ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල |
| 2. ස්වභාවය | : | උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම |
| 3. අදාල චක්‍රලේඛයන් | : | I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව<br>II ගිණුම් තැබිම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය හා 2006.12.22 දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව |
| 4. ආරම්භ කළ දිනය | : | 1996 දෙසැම්බර් 20 |
| 5. කාර්යාලය | : | පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය |
| 6. බැංකුව | : | පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848 |

## 7. අරමුදලේ පරමාර්ථ:

- ✓ ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියා මාර්ග ගැනිම.
- ✓ පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩසටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යමය ආධාර සැපයිම.
- ✓ ශාක එකතුව පිළිබඳව ද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.
- ✓ විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනැම හදිසි ඉදිකිරිමේ කටයුත්තක් භාර ගැනිම.
- ✓ අවශ්‍ය අවස්ථාවන්හිදී පුනරාවර්තන ප්‍රතිපාදන වල ඌණතාවයන් ඌණපුරණය කිරීම.

<u>**2014 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය**</u>

| | | | |
|---|---|---|---|
| 2014-01-01 දිනට බැර ශේෂය | = | රු. | 109,337,504.86 |
| <u>**එකතු කළා:**</u> | | | |
| 2014 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. | 106,068,820.00 |
| | | | -------------------- |
| එකතුව | | රු. | 215,406,324.86 |
| <u>**අඩු කළා :**</u> | | | |
| 2014 වර්ෂයේ වියදම් (හර කිරීම්) | = | රු. | 90,994,628.65 |
| | | | -------------------- |
| 2014.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය | = | **රු.** | <u>**124,411,696.21**</u> |

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමනි)

## අරමුදලේ ප්‍රතිපාදනය යොදා ගනිමින් 2014 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- මෙම වර්ෂයේ උද්‍යානයේ දැකුම්කළු ලෙස නඩත්තු කිරීම සඳහා උද්භිද උද්යාන භාර අරමුදලින් ප්‍රතිපාදන සලසමින් උද්භිද උද්‍යානය ඉතා ආකර්ශනීය මට්ටමකින් වර්ෂය තුල පවත්වාගෙන යන ලදී.




රාජකීය උද්භිද උද්‍යානයේ දර්ශනයක්



හක්ගල උද්භිද උද්‍යානයේ දර්ශනයක්

- මෙම වර්ෂයේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අතුරු මාර්ග (අඩි පාරවල්) සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ පහසුවත්, උද්‍යානයේ අලංකාරීත්වය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.





රාජකීය උද්භිද උද්‍යානයේ අතුරු පාරවල් සංවර්ධනය කර ඇති අයුරු



- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගවයන්ට ලැගුම් ගැනීම සඳහා නවීන ක්‍රමයේ ගව ගාලක් ඉදි කරන ලදී.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඉදි කරන ලද නව ගව ගාල

- මිලියන 3.4 ක් වියදම් දරා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ශාකාගාර ගොඩනැගිල්ල (National Herbarium Building) , අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, මල්වගා පර්යේෂණ ගොඩනැගිල්ල ඇතුළු ප්‍රධාන ගොඩනැගිලි හා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල අකුණු සැරවලින් ආරක්ෂා කිරීම සඳහා අකුණු සන්නායක සවි කරන ලදී .

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ලංකා පොකුණ අලුත්වැඩියා කිරීමට අරමුදලින් රු. මිලියන 1.04 ක වියදමක් දරන ලදී. ඒ අනුව ලංකා පොකුණ පසුබිම කොටස සංචාරකයින්ගේ සිත් ඇද ගන්නා ලෙස දර්ශනීය ලෙස පවත්වාගෙන යාමට හැකි විය.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ලංකා පොකුණ

- උද්‍යානයේ නිලධාරින්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අරමුදලින් වියදම් දරන ලදී. ඒ යටතේ නිල නිවාස අලුත්වැඩියාවන් සිදු කර, පහසුකම් සලසා දෙන ලදී.

- උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා ශාක ලේබල් කිරීම ආරම්භ කරන ලදී. උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට මඟ පෙන්වීමේ නාම පුවරු යෙදීම අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම වර්ෂය තුල ඉටු කරන ලදී.




පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ශාක ලේබල් සහ නාමපුවරු සවි කර ඇති ආකාරය

**හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වැඩ අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ඉටු කර ඇත.**

- ඒ අනුව හක්ගල උද්භිද උද්‍යානයේ ඉතා දැකුම්කළු කොටසක (ලොක් සුඹුල් කොටසට ඉහල කොටස) පඳුරු උද්‍යානයන් සකස් කිරීමට පියවර ගන්නා ලදී. හක්ගල උද්භිද උද්‍යානයේ වන සතුන් බහුල බැවින් එම සතුන්ගෙන් මෙම පඳුරු උද්‍යාන කොටස ආරක්ෂා කර ගැනීම සඳහා එම කොටස වටේම මීටර් 900 ක් පමණ දිග “චේන්ක් ලින්ක් “ වලින් ආවරණය කරන ලදී.



වන සතුගෙන් පඳුරු උද්‍යාන ආරක්ෂා කිරීම සඳහා සවි කරන ලද චේන් ලින්ක් වැට

- හක්ගල උද්භිද උද්‍යානයේ අතුරු පාරවල් සංවර්ධනය කර නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ පහසුකම් වැඩි දියුණු කිරීමටත්, උද්‍යානය දර්ශනීය ලෙස නඩත්තු කිරීමටත් කටයුතු කරන ලදී.





හක්ගල උද්‍යානයේ අතුරු පාරවල් (ඉන්ටර්ලොක් අතුරා) සංවර්ධනය වූ අයුරු

- හම්බන්තොට උද්භිද උද්‍යානයේ පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස අරමුදල යටතේ රුපියල් මිලියන 3.2 ක වියදමින් ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලදී.




හම්බන්තොට උද්‍යානයට මිලදී ගන්නා ලද ගෘහ භාණ්ඩ

උද්භිද විද්‍යාත්මක පර්යේෂණ කටයුතු සඳහා ජාතික ශාකාගාරයට ( National Herbarium) “Fume Cupboard” එකක් මිලදී ගත් අතර, PH අගය මැනීම සඳහා උපකරණ ඇතුළු පර්යේෂණ කටයුතු සඳහා උපකරණ රුපියල් මිලියන 2ක පමණ වියදමක් දරා මිලදී ගෙන ඇත.



**පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගත්**

Fume Cupboard

මීට අමතර පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පොත්පත් මිලදී ගෙන ඇත. එසේම වර්ෂය තුල ශාක ගවේෂණ, පර්යේෂණ කටයුතු සඳහා කේෂ්ත්‍ර රාජකාරී කටයුතු වල නිලධාරින් යොදවා ගෙන ඇත.



**අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ අලංකාර දර්ශනයක්**

- විස්සාවේල්ල උද්‍යානයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භාර අරමුදලින් ප්‍රතිපාදන සලසන ලදී. මෙම උද්‍යානය මහජනයා සඳහා මේ වසරේදී විවෘත කිරීමට නියමිතව ඇත. එම නිසා රථවාහන නැවැතුම්පල සහ ඉදිරිපස ප්‍රධාන දොරටුව සහ පාරට මුහුණලා ඇති කොටසේ උද්භිද උද්‍යානයට ගැලපෙන පරිදි අලංකාරවත් වැටක් නිම කිරීමට කටයුතු කර ඇත. මෙම කාර්ය බස්නාහිර පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඉටු කරමින් පවතී, මෙම

කාර්යයන් සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදලින් රුපියල් මිලියන 32 ක ප්‍රතිපාදන සලසා දෙන ලදී.

- ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ ඖෂධ පැල සහ වෙනත් පැල රෝපණය කිරීමේදී වියළි කාලයට ජලය සපයා ගැනීම බෙහෙවින් අසීරු වී ඇත. එම නිසා අලෙවිය සඳහා පිලියෙල කරන ඖෂධ පැල නිෂ්පාදනය වියළි කාලයේදී බෙහෙවින් අඩුවේ.

එම නිසා පිටතින් ජලය ලබාගැනීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටරයක් සහ වතුර බවුසරයක් මිලදී ගැනීමට අරමුදලින් රුපියල් මිලියන 2.5 ක ප්‍රතිපාදන සලසන ලදී.




උද්‍යාන නඩත්තු කටයුතු සඳහා මිලදී ගත් ට්‍රැක්ටර්

## අරමුදල යටතේ 2014 වර්ෂය තුල ඉටු කරන ලද

## විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| | කාර්යය | ඇස්තමේන්තුව (රු.) | 2014 -12-31 දිනට මුළු වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | භාරකාර මණ්ඩල පරිපාලන කටයුතු සඳහා වියදම | 302,500.00 | 291,383.00 | 11,117.00 |
| 2 | උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරීමේ වියදම | 25,522,500.00 | 23,378,506.25 | 2,143,993.75 |
| 3 | රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 27,000,000.00 | 25,995,098.29 | 1,004,901.71 |
| 4 | හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 12,522,000.00 | 11,340,592.37 | 1,181,407.83 |
| 5 | අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 32,053,000.00 | 27,834,230.18 | 4,218,769.82 |
| 6 | ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම | 2,600,000.00 | 2,154,818.56 | 445,181.44 |
| | එකතුව | 100,000,000.00 | 90,994,628.65 | 9,005,371.55 |

එම්.අයි.එම්. රාෆීක්
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ
ලේකම්, සංචාරක හා ක්‍රීඩා
අමාත්‍යාංශය.

ආචාර්ය ඩී.එච්.පී.පෙරමුණුගම
ලේකම්, උද්භිද උද්‍යාන භාර සහ අරමුදල
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.